# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/93 – 2018 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා – 2018.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර පලිස්පත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ, ඇල්ලියද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/එම්ඩීබී/2017/356 හා 2017.07.31 දිනැති පුගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0177 ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – අලියාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0177

උතුරට සහ නැගෙනහිරට: එස්. කේ. විජේරත්න හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: ඇළ, මාර්ගය සහ එන්. ටී. අනෝමා විනීතමාලා හිමිකම් කියන අලියාවත්ත; බටහිරට: එන්. ටී. අනෝමා විනීතමාලා හිමිකම් කියන අලියාවත්ත සහ එස්. කේ. විජේරත්න හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2015/එච්ජ්/191.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කේඩීඑස්/එම්ඩීබී/4/2/1/207.
2018 අගෝස්තු මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 623